සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

1983

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.......................................................... විභාග අංකයඃ-..........................................................

අයදුම්කරුවන්ට උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I - කොටස

- ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා, දී ඇති කරුණු අතරින් වඩා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(දවුල, පංචමය, කල්‍යාණ, දෙක, තම්මැට්ටම, ථාට)

01. රාගයක මධ්‍යමය හා ........................................................ එකවර වර්ජ නොවේ.
02. හින්දුස්ථානි රාගධාරි සංගීතයේ ........................................................ දහයක් ඇත.
03. ........................................................ විතතාතත වාද්‍ය භාණ්ඩයකි.
04. අපරදිග සංගීතයේ Minim (මිනිම්) එකක වටිනාකම මාත්‍රා ........................................................ කි.
05. භූපාලි රාගය ........................................................ ථාටයෙන් බිහි වේ. (ලකුණු 2 x 5 = 10)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණත් වැරදි නම් (✗) ලකුණත් ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06. |x x|x x x|x x|x x x| මෙය මිශ්‍ර මත්කැටි යෙදෙන රිද්ම රටාවකි. ( )
07. ගිටාරය තත් වාද්‍ය භාණ්ඩයක් නොවේ. ( )
08. සර්ගම්, ස්වරවලින් පමණක් නිර්මාණය වී ඇත. ( )
09. වන්නම්, ප්‍රශස්ති, හටන් ගී, මේවා සේ ගී වර්ගයට අයත් වේ. ( )
10. ගරි, ගප, ධනිස භූපාලි රාගයේ මුඛ්‍යාංගයයි. ( ) (ලකුණු 2x5=10)

- ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා, දී ඇති පිළිතුරු අතරින් වඩා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. සිංගල් රීඩ්, ත්‍රිසෙට්, සයිඩ් බැලෝ යනුවෙන් වර්ග වී ඇති සංගීත භාණ්ඩය කුමක් ද?
    1. විද්‍යුත් ස්වර පුවරුව 2. එකෝඩියනය 3. සර්පිනාව 4. මවුත් ඕගනය

12. භූපාලි සහ බිලාවල් රාග දෙක පිළිබඳ නිවැරදි කියමන් පිළිවෙලින්,
    1. ශුද්ධ ස්වර යෙදේ, රාත්‍රි කාලයේදී ගායනය වාදනය වෙයි.
    2. බිලාවල් ථාටයෙන් බිහි වී ඇත, ශුද්ධ ස්වර යෙදේ.
    3. ශුද්ධ ස්වර 7 ක් යෙදේ. දිවා කාලයේදී ගායනය වේ.
    4. ම සහ නි ස්වර වර්ජිතය, ධෛවතය වාදී ස්වරයයි.

13. ගිටාරයේ තත් සුසර කරන ස්වර මොනවා ද?

1. E A D G B E   2. E F G A B C   3. E G B D F A   4. E A C G B E

14. "දක්කොත් පද්මාවතී ආලෙ නොකරා බැරී.." යන ගීතය ගායනයේදී වාදනයට සුදුසු තාල වාද්‍ය භාණ්ඩය වනුයේ,

1. ගැටබෙරයයි.   2. මද්දලයයි.   3. දවුලයි.   4. තබ්ලාවයි.

15. "දොහොරාව" නම් වූ තාල රහිත ගීත කොටස් ගැයෙන නාට්‍ය ගී වර්ගය කුමක් ද?

1. කෝළම් ගී   2. සොකරි ගී   3. නූර්ති ගී   4. නාඩගම් ගී

16.  මෙහි දැක්වෙන Rest (විරාම) ලකුණ නම් කරනුයේ,

1. Semi Breve Rest (සෙමිබ්‍රිව් රෙස්ට්) යනුවෙනි.   2. Minim Rest (මිනිම් රෙස්ට්) යනුවෙනි.

3. Crotchet Rest (ක්‍රොචෙට් රෙස්ට්) යනුවෙනි.   4. Quaver Rest (ක්වේවර් රෙස්ට්) යනුවෙනි.

17. රාග විස්තර ඇතුළත් හින්දුස්ථානී රාගධාරී ගායන විශේෂය වනුයේ,

1. මධ්‍යලය ගීතයි.   2. ලක්ෂණ ගීතයි.   3. භජන් ගීතයි.   4. කව්වාලි ගීතයි.

18. සරිග, රිගම, ගමප, මපධ, පධනි, ධනිසං යන ස්වර අභ්‍යාසය කාෆි රාගයට අනුව ලියූ විට,

1. ම සහ නි වර්ජිත වේ.   2. කිසිවක් සිදු නොවේ.

3. මධ්‍යමය තීව්‍ර වේ.   4. ගාන්ධාරය සහ නිෂාධය කෝමළ වේ.

19. G A $\overset{\frown}{B\,C}$ D E $\overset{\frown}{F^{\#}G}$ යනුවෙන් දැක්වෙන Major ස්කේලය කුමක් ද?

1. C Major ස්කේලයයි.   2. F Major ස්කේලයයි.

3. G Major ස්කේලයයි.   4. $B^{b}$ Major ස්කේලයයි.

20. හුණුවටය, නරිබෑණා යන නාට්‍ය ඇතුළත් නාට්‍ය ශෛලිය කුමක් ද?

1. නූර්ති   2. නව නාට්‍ය   3. සොකරි   4. කෝළම්

(ලකුණු 2 x 10 = 20)

(මුළු ලකුණු 40)

## II කොටස

සැ. යු. ● පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. කෙටි පිළිතුරු ලියන්න.

1. දේශීය තූර්ය වාදන භාණ්ඩ වර්ගීකරණය හඳුන්වන නම කුමක් ද?
2. මව්ගුණ හෝ පියගුණ ගීයක මුල් පාදය ලියන්න.
3. අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව තත් වාද්‍ය භාණ්ඩ හඳුන්වන නම කුමක් ද?
4. උකුසා වන්නම ගැයෙන දේශීය තිත් රූපය නම් කරන්න.
5. ජන ගී ආශ්‍රිත සරල ගීයක මුල්පාදය ලියන්න.
6. "නොමදින් විකුම්පාලා", මෙම ගීතය ඇතුළත් සෙගී වර්ගය කුමක් ද?
7. බිලාවල් රාගයේ අනුවාදී ස්වර ලියන්න.
8. සරිගම/පධනි.... යන ස්වර අයත් ථාටය කුමක් ද?
9. සංගීත ප්‍රසංගයකදී යොදාගන්නා අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලම් දෙකක නම් ලියන්න.
10. මධ්‍යම භාවයෙන් ශුද්ධ ස්වර සප්තකය වාදනය වන විට කෝමළ ............................................ ත් පංචම භාවයෙන් ශුද්ධ ස්වර සප්තකය වාදනය වන විට තීව්‍ර ............................... ත් වාදනය වේ.

(ලකුණු 12)

02. 1. බිලාවල් රාගයේ මධ්‍යලය ගීතයක ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

2. කාෆි රාගයේ සර්ගම් ගීතයක ස්ථායී කොටස ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

3. භූපාලී රාගයට අනුව සරිග, රිගප............................ ස්වර අභ්‍යාසය උච්ච සඩ්ජය දක්වා ලියන්න.

(ලකුණු 04)


03. 1. පහත සඳහන් කරුණු අතරින් ඔබ කැමති 4 ක් පිළිබඳ නිදසුන් සහිතව විස්තර කරන්න.

1. රාග ජාතිය　　2. ථාට　　3. වාදී ස්වරය
4. සංවාදී ස්වරය　　5. අනුවාදී ස්වර　　6. වර්ජ ස්වර
7. විවාදී ස්වර

(ලකුණු 08)

2. දාදරා තාලය හෝ කෙහෙර්වා තාලය හෝ ත්‍රිතාලය අතරින් එක් තාලයක ඨේකාව නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

04. 1. පහත දක්වෙන ප්‍රස්තාරයේ අංක 1, 2, 3, 4 දක්වෙන සංකේත නම් කරන්න.




(ලකුණු 08)

2. F Major scale (F මේජර් ස්කේලය) ස්වර ලියන්න. (ලකුණු 02)

3. ♭ , ♮ යන අපරදිග සංකේත දෙක නම් කරන්න. (ලකුණු 02)

05. 1. වන්නම්, ප්‍රශස්ති, හටන් යන ගී අතරින් දෙකක් පිළිබඳ කරුණු දෙක බැගින් ලියන්න. (ලකුණු 04)
2. ඔබ තෝරා නොගත් ගී වර්ගයට අයත් ගීතයක මුල් කොටස ලියන්න. (ලකුණු 02)
3. දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණය නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

06. 1. ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතයේ නිර්මාතෘවරයා කවු ද? (ලකුණු 02)
2. කණ්ඩායම් ගීත හා සම්බන්ධ සංගීතමය තොරතුරු ඇසුරින් කරුණු 3 ක් ලියන්න. (ලකුණු 03)
3. කණ්ඩායම් සංගීතය සඳහා ප්‍රසිද්ධියක් උසුලන කණ්ඩායම් 3 ක නම් ලියන්න. (ලකුණු 03)
4. කණ්ඩායම් ගීතයක මුල් ගී පාද දෙක ලියන්න. (ලකුණු 04)

07. ගිටාරය, සර්පිනාව, විදුලි ඕගනය, එකෝඩියන් යන සංගීත භාණ්ඩ අතරින්,
ඔබ කැමති එක් සංගීත භාණ්ඩයක් පිළිබඳ පාසල් සඟරාවකට ලිපියක් සකස් කරන්න.
(සංගීත භාණ්ඩයේ ඉතිහාසය, දළ රූපසටහනක්, වාදන ක්‍රම, සුවිශේෂී ලක්ෂණ ඇතුළත් විය යුතු ය)
(ලකුණු 12)